**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත**

**08 වන වගන්තිය - අර්ධ වාර්ෂික වාර්තාව**

**පළමු කොටස**

**වර්ෂය 2026 ජනවාරි 01 දින සිට ජුනි 30 දක්වා**

පළමු කොටස

**01. අමාත්‍යාංශය තොරතුරු**

- **I.** **අමාත්‍යතුමාගේ නම /පළාත් ආණ්ඩුකාරතුමාගේ නම :**
- **II.** **අමාත්‍යාංශයේ නම :-**
- **III.** **(පළාත් සභා අමාත්‍යාංශ වන කල්හි පළාත) :-**
- **IV.** **ලිපිනය :-**
- **V.** **දුරකථන අංක (පොදු ) :-**
- **VI.** **විද්‍යුත් තැපැල :-**
- **VII.** **වෙබ් අඩවිය :-**

02. සංවිධාන ව්‍යුහය :- ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය




**03.** අමාත්‍යාංශයේ කර්තව්‍ය හා ක්‍රියාකාරකම් (අංශ /ශාඛා අනුව)

| අංශය/ ශාඛාව | ප්‍රධාන කර්තව්‍යයන් ක්‍රියාකාරකම් සැකෙවින් | සම්බන්ධිත දුරකථන අංක |
|---|---|---|
| | | |
| | | |
| | | |

## 04. අමාත්‍යාංශ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී නියමිත කාර්ය පටිපාටි හා සම්මතයන්

| කාර්යයන් /කර්තව්‍යයන් | කාර්යයන් / කර්තව්‍යයන් හා කර්තව්‍යයන් හා සම්මතයන් අඩංගු වන ලිඛිත නීති රෙගුලාසි සඳහන් වන පනත් / රීති/ නියෝග /රෙගුලාසි/ මාර්ගෝපදේශ/ චක්‍ර ලේඛන/ අත්පොත් හා වෙනත් වාර්තා ලැයිස්තුව | වාර්තාවල තොරතුරු ලබා ගත හැකි වෙබ් අඩවිය |
|---|---|---|
| | | |
| | | |
| | | |

දෙවන කොටස

## 05. අමාත්‍යාංශ යටතේ වන පොදු අධිකාරින්වල තොරතුරු

| පොදු අධිකාරියේ නම | ලිපිනය | දුරකථන අංක පොදු ( පොදු ) | වෙබ් අඩවිය | විද්‍යු තැපැල | තොරතුරු නිලධාරී නාම තනතුරු දුරකථන අංක |
|---|---|---|---|---|---|
| ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - | නො.24/4, කාසල් වීදිය,කොළඹ 08 | 011-2695579 | www.rdtri.gov.lk | slrdtri@gmail.com | ඒ.එම්.එස් අතපත්තු මයා පුහුණු හා පර්යේෂණ නිලධාරි 011-2695579 |

## 06. අමාත්‍යාංශය හා එක් එක් පොදු අධිකාරී ප්‍රධාන විධායකයින් කාර්යයන් හා කර්තව්‍යයන්

**I. පොදු අධිකාරියේ නම** - ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**II. තනතුරු අනුව බලතල කාර්ය හා කර්තව්‍ය**

| ප්‍රධාන තනතුරු | තනතුරට පැවරෙන බලතල , කාර්යය හා කර්තව්‍යයන් |
|---|---|
| **අධ්‍යක්ෂ**<br><br>**ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය** | • ආයතනයේ දැක්ම, මෙහෙවර හා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතනයේ සමස්ත පරිපාලනය, පුහුණු, පර්යේෂණ හා තොරතුරු සැපයීමේ කාර්යයන් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.<br>• ජාතික ග්‍රාමීය හා ප්‍රජා සංවර්ධන ප්‍රතිපත්ති, උපායමාර්ග සහ අමාත්‍යාංශයේ ප්‍රමුඛතා අනුව ආයතනයේ කෙටි, මධ්‍ය හා දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම.<br>• ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, පුහුණු සැලැස්ම, පර්යේෂණ සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම, අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සහ ඒවායේ ක්‍රියාත්මකභාවය අධීක්ෂණය කිරීම.<br>• ආයතනය යටතේ පවත්වනු ලබන සියලු පුහුණු වැඩසටහන්, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ හා ක්ෂේත්‍ර වැඩසටහන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ගුණාත්මකභාවය තහවුරු කිරීම.<br>• ග්‍රාමීය හා ප්‍රජා සංවර්ධනයට අදාළ පර්යේෂණ අවශ්‍යතා හඳුනාගෙන පර්යේෂණ වැඩසටහන් ආරම්භ කිරීම, පර්යේෂණ යෝජනා අනුමත කිරීම, ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදනය සඳහා යොමු කිරීම.<br>• "ප්‍රජාශක්ති" ජාතික ව්‍යාපාරය ඇතුළු අමාත්‍යාංශය විසින් ආයතනය වෙත පවරනු ලබන ජාතික වැඩසටහන්වල පුහුණු, ධාරිතා සංවර්ධන, පර්යේෂණ, පසුවිපරම් හා ඇගයීම් කාර්යයන් මෙහෙයවීම.<br>• ග්‍රාමීය සංවර්ධන සැලසුම්, පස් අවුරුදු ගම් සංවර්ධන සැලසුම් සහ ප්‍රජා මට්ටමේ සංවර්ධන ක්‍රියාවලීන් සඳහා අවශ්‍ය පුහුණු මොඩියුල, මාර්ගෝපදේශ, ආකෘති හා ඇගයීම් උපකරණ සංවර්ධනය කිරීම.<br>• දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන පුහුණු හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත්දායක |

| | |
|---|---|
| | සංචිත පිහිටුවීම, ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම හා කාර්යසාධනය අධීක්ෂණය කිරීම.<br>• පුහුණු සහ පර්යේෂණ වැඩසටහන්වල ප්‍රතිඵල, බලපෑම හා තිරසරභාවය මැනීම සඳහා සුදුසු අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේද ස්ථාපිත කිරීම.<br>• ආයතනයේ සියලු අංශ, නිලධාරීන් සහ සේවකයන් සඳහා රාජකාරි පැවරීම, වැඩ බෙදාහැරීම, කාර්යසාධන ඉලක්ක නියම කිරීම හා කාර්යසාධනය සමාලෝචනය කිරීම.<br>• ආයතනයේ නිලධාරීන්ගේ පැමිණීම, විනය, සාමාන්‍ය හැසිරීම, ඵලදායීතාව සහ වගකීම්සහගතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම.<br>• නිලධාරීන්ගේ පුහුණු හා වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතනික ධාරිතා සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.<br>• ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ අනෙකුත් අදාළ නීති හා විධිවිධානවලට අනුකූලව ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම.<br>• ආයතනයට වෙන් කරනු ලබන ප්‍රතිපාදන කාර්යක්ෂමව, ඵලදායීව, විනිවිදභාවයෙන් හා අරපිරිමැස්මෙන් භාවිත කිරීම සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය නිතිපතා සමාලෝචනය කිරීම.<br>• ආයතනයේ ප්‍රසම්පාදන, ගිවිසුම්, ගබඩා, වත්කම්, වාහන, නේවාසිකාගාර හා පුහුණු පහසුකම් නිසි පරිදි කළමනාකරණය කිරීම.<br>• බොරැල්ල ප්‍රධාන කාර්යාලය සහ පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය ඇතුළු ආයතනය සතු ගොඩනැගිලි, ඉඩම්, උපකරණ හා අනෙකුත් රාජ්‍ය වත්කම් ආරක්ෂා කිරීම සහ උපරිම ප්‍රයෝජනයට ගැනීම.<br>• අමාත්‍යාංශය, ජනාධිපති කාර්යාලය, වෙනත් රාජ්‍ය ආයතන, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, පළාත් හා දිස්ත්‍රික් පරිපාලන ආයතන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.<br>• ග්‍රාමීය සංවර්ධනයට අදාළ නව දැනුම, යහපත් භාවිතයන් හා පර්යේෂණ ප්‍රතිඵල හුවමාරු කිරීම සඳහා සම්මන්ත්‍රණ, පර්යේෂණ සමුළු, ප්‍රකාශන හා දැනුම් කළමනාකරණ වැඩසටහන් සංවිධානය කිරීම.<br>• ආයතනයේ ප්‍රගතිය පිළිබඳ මාසික, කාර්තුමය, අර්ධවාර්ෂික හා වාර්ෂික වාර්තා සකස් කර නියමිත කාලයට අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් ආයතන වෙත ඉදිරිපත් කිරීම.<br>• ආයතනයේ සේවාලාභීන් හා මහජනතාව වෙත කාර්යක්ෂම, සාධාරණ හා ගුණාත්මක සේවාවක් සැපයීම |

| | |
|---|---|
| | සහ මහජන පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.<br>• අමාත්‍යාංශ ලේකම්වරයා, අදාළ අතිරේක ලේකම්වරයා හෝ නිසි බලධාරියා විසින් කලින් කලට පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම. |
| **නියෝජ්‍ය අධ්‍යක්ෂ ( සැලසුම්)**<br>**ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය** | අධ්‍යක්ෂකගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ පහත කටයුතු ඉටු කිරිම.<br><br>• වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම් හා අනුමත කිරිම් සම්බන්ධ කටයුතු<br>• ගරු අමාත්‍යතුමාගේ සහ ලේකම්තුමාගේ රැස්වීම් වලට අදාලව ප්‍රගතිය වාර්තා කිරිම සහ සාකච්ජා කිරිම් සම්බන්ධ කටයුතු<br>• පර්යේෂණය ප්‍රකාශන අංශවල කටයුතු මෙහෙයවීම අධීක්ෂණය, සම්බන්ධීකරණ කටයුතු, කාර්තුමය වශයෙන් වාර්තා සකස් කිරීම. හා අමාත්‍යාංශය වෙත නියමිත දිනට ලබා දිම සම්බන්ධව අධීක්ෂණ කටයුතු<br>• ප්‍රගතියට අදාල සැලසුම් අංශ විසින් පවත්වනු ලබන විද්‍යුත් දත්ත පද්ධතියේ යාවත්කාලීන කිරීම සම්බන්ධ කටයුතු ආයතනයේ ගෙවීම් වලට අදාල වවුචර් නිර්දේශ කිරිමේ කටයුතු<br>• විගණන විමසුම් සම්බන්ධව පිළිතුරු සකස් කිරිම.<br>• අධ්‍යක්ෂ විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි . |

| | |
|---|---|
| **නියෝජ්‍ය අධ්‍යක්ෂ**<br>**ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ මධ්‍යසථානය , පිළිමතලාව** | අධ්‍යක්ෂකගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ පහත කටයුතු ඉටු කිරිම.<br><br>• කාර්ය මණ්ඩලයේ සියලුම පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම සහ ඔවුන්ගේ වරප්‍රසාද ( නිවාඩු, වැටුප් වර්ධක ආදිය) කළමනාකරණය කිරීම.<br>• පිළිමතලාව පුහුණු මධ්‍යසථානයේ දෛනික තැපැල් කටයුතු, ලේඛනාගාරය සහ තොරතුරු පද්ධති නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම.<br>• පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය සතු වාහන පාලනය කිරිම ඉන්ධන සහ නඩත්තු කටයුතු විධිමත් කිරිම.<br>• පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ භෞතික ප්‍රමිතිය සහ පිරිසිදුකම පවත්වා ගැනිම.<br>• ආයතනික විනය සහ චර්යාධර්ම පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක වන බවට වග බලා ගැනිම.<br>• ආයතනයට අදාළ මූල්‍ය අවශ්‍යතා සහ ප්‍රසම්පාදන අවශ්‍යතා හඳුනාගෙන ඒවා අධ්‍යක්ෂවරයා වෙත නිර්දේශ කිරීම.<br>• අවස්ථානුකූලව ලංසු ඇගයීම් කමිටුවල සභාපති / සාමාජික වශයෙන් කටයුතු කිරීම.<br>• පරිපාලන අංශයට අදාළ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය සහ භාණ්ඩ තොග පාලනය<br>• වියදම්වලට අදාළ වවුචර නිර්දේශ කර ඉදිරිපත් කිරීම.<br>• අධ්‍යක්ෂවරයාගේ උපදෙස් පරිදි ආයතනික රැස්වීම් සහ උත්සව සම්බන්ධීකරණය කිරීම.<br>• පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ සාමාන්‍ය පරිපාලන කටයුතු<br>• අධ්‍යක්ෂ විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී |

**07.** අමාත්‍යාංශය හැර ඒ යටතේ වන එක් එක් පොදු අධිකාරියෙහි ක්‍රියාකාරකම්වලට අදාළ වන නීති රීති

**පොදු අධිකාරියේ නම - ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - නො.24/4, කාසල් වීදිය,කොළඹ 08**

| කාර්යයන් කර්තව්‍යයන් | කාර්යයන් /කර්තව්‍යයන් හා සම්මතයන් අඩංගු වන ලිඛිත නීති රෙගුලාසි සඳහන් වන පනත්/ රීති /නියෝග/ රෙගුලාසි මාර්ගෝපදේශකම/ අත්පොත් වාර්තා ලැයිස්තුව | වාර්තාවල තොරතුරු ලබාගත හැකි වෙබ් අඩවිය |
|---|---|---|
| • ක්ෂේත්‍ර නිලධාරීන්, පුහුණුකරුවන් සහ ප්‍රජා සංවර්ධන සභා නියෝජිතයන්ගේ ධාරිතාව සංවර්ධනය කිරීම.<br><br>• පුහුණු මොඩියුල, ප්‍රකාශන සහ දැනුම් සම්පත් සකස් කිරීම.<br><br>• ප්‍රතිපත්ති සම්පාදකයන් සහ සංවර්ධනවේදීන් සඳහා පර්යේෂණ හා තොරතුරු සම්පාදනය කිරීම<br>.<br>• ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂඥ දැනුම සමාජගත කිරීම | | **www.rdtri.gov.lk** |

## තුන්වන කොටස

**08.** අමාත්‍යාංශයට හා එක් එක් පොදු අධිකාරීය වෙනුවෙන් /රජයේ අයවැයෙන් පළාත් සහා මුදල් ප්‍රකාශයෙන් / ස්වයං අයවැය ලේඛන මගින් වෙන් කරන ලද ආදායම් හා වියදම් තොරතුරු

පොදු අධිකාරිය නම :- **ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය**

8.1 **ආදායම් විස්තරය**

| ප්‍රධාන ආදායම් වර්ගීකරණය | ඇස්තමේන්තු කළ ආදායම (රුපියල් මිලියන) | සත්‍ය වශයෙන් රැස් කළ ආදායම් (රුපියල් මිලියන ) |
|---|---|---|
| | | **3.381** |

**8.2** වියදම් විස්තරය

රාජ්‍ය අයවැය / මුදල් ප්‍රකාශ/ ස්වයං අය වැය අනුව

| ප්‍රධාන වියදම් වර්ගීකරණය | ඇස්තමේන්තු කළ වියදම රුපියල් මිලියන | සත්‍යය වශයෙන් වියදම් රුපියල් මිලියන |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 68.6 | 24.286 |
| ප්‍රාග්ධන වියදම් | 11.2 | 1.113 |

**8.3** ආදායම් වියදම් පිළිබඳව විස්තරාත්මක ගාස්තු ගෙවා ලබාගත හැකි කාර්යාල ලිපිනය හා වෙබ් අඩවිය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - නො.24/4, කාසල්වීදිය,කොළඹ 08

වෙබ් අඩවිය - www.rdtri.gov.lk

## 09. අමාත්‍යංශ හා පොදු අධිකාරීන්වල තොරතුරු ලබාගැනීමට පුරවැසියන්ට සපයා ඇති පහසුකම්

| අමාත්‍යංශ හා පොදු අධිකාරිය නම | නිකුත් කර ඇති ප්‍රකාශන | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශන | මිළ | ලබා ගත හැකි කාර්යාල | වෙබ් අඩවිය |

| | | | | |
|---|---|---|---|---|
| **ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය** | 1.පරිධියේ මිනිසෙක්<br><br>2.ග්‍රාම සංවර්ධනය හා සංවර්ධනය<br><br>3.නව සංවර්ධන ප්‍රවේශය<br><br>4. ග්‍රාම සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රීය සගරාව<br><br>5.ප්‍රජා ශක්ති අර්ධ වාර්ෂික සගරාව<br>6. බොරැල්ල හා පිළිමතලාව මධ්‍යස්ථාන වල ඇති පුස්තකාල දෙකේ පොත් 7000 ක් | රු: 600.00<br><br>රු.:220.00<br><br>රු: 100.00<br><br>රු: 100.00 | **ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - බොරැල්ල** | www.rdtri.gov.lk<br><br>Rural Development Training and Research Institute ( face book page) |